# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම
## (සංස්ථාගත කිරීමේ)

**අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම**
**සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය විසින්
2016 ජනවාරි මස 29 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 දෙසැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[76 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ)

## අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

''අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක      දරන අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, සියලු අධිකරණ කටයුතුවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

2—PL 009717 — 225 (2016/01)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ ජනවර්ග අතර සාමය, හොඳහිත, අවබෝධය හා සහයෝගය වර්ධනය කිරීම;

(ආ) පාසල් සිසු දරු දැරියන් ගේ අධ්‍යාපනික, දාර්ශනික, ආගමික, සංස්කෘතික හා විද්‍යාත්මක කටයුතු දියුණු කර ගැනීමට උදව් කිරීම සහ ස්ථාපනය කිරීමට කටයුතු කිරීම;

(ඇ) ආධාර ලැබීමට සුදුසු පාසල් දරු දැරියන් හට තම අධ්‍යාපනය විධිමත් ලෙස නොකඩවා කරගෙනයාම සඳහාත්, පාසල් අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාම සඳහාත්, නොකඩවා පාසල් යාම දිරිගැන්වීම සඳහාත් ආධාර, දීමනා, ත්‍යාග හා ශිෂ්‍යත්ව ලබාදීමෙන් ඔවුන් දිරිගැන්වීම;

(ඈ) සුදුසු හා අවශ්‍ය පාසල් සිසු දරු දැරියන්හට ඔවුන්ගේ සමාජයීය, ආර්ථික හා අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සංගමය විසින් සුදුසු යයි හැඟෙන පරිදි ඔවුන්ගේ සුභසාධනය සඳහා කටයුතු කිරීම;

(ඉ) ශ්‍රී ලාංකීය ජනතාව තුළ මිනිස් අයිතිවාසිකම්, මිනිස් ගුණධර්ම හා සමාජීය සාර්ධර්ම, මූලික නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා අයිතිවාසිකම් පිළිබඳ දැනුම වර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම;

(ඊ) සුදුසු හා අවශ්‍ය පාසල් දරු දැරියන්හට උසස් අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව හොඳින් කරගෙන යාම සඳහා පදනම විසින් සුදුසු යයි හැඟෙන පරිදි ආධාර, දීමනා, ත්‍යාග හා ශිෂ්‍යත්ව පිරිනැමීම;

(උ) ආධාර ලැබීමට සුදුසු උසස් අධ්‍යාපනය ලබන පාසල් සිසු දැරියන්ට ස්වකීය අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම මගින් හා වෙනත් සුදුසු අයුරින් අනුබල දීම;

(ඌ) කාන්තාවන්, ළමයින්, ආබාධිත අය හා සමාජ අසාධාරණකම්වලට ලක්වූවන්ගේ මානසික හා ආර්ථික ශක්තිය වැඩිදියුණු කිරීම හා සවිබල ගැන්වීම අරමුණු කොටගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනුබල දීම;

(එ) පාසල් සිසු දරු දැරියන් තුළ මානවවාදී, ක්‍රීඩා, සාහිත්‍ය, සෞන්දර්ය ක්‍රියාකාරකම් හා අධ්‍යාත්මික ගුණවගාව වැඩිදියුණු කිරීම හා පිළිබඳ කටයුතු කිරීම;

(ඒ) ගෞරවනීය සංඝයා වහන්සේලා උදෙසා සිවුපසය, ආවාස, විහාරාරාම ආදිය පිළිගැන්වීම හා වැඩිදියුණු කිරීම උදෙසා කටයුතු කිරීම;

(ඔ) ගෞරවනීය සංඝයා වහන්සේලාගේ සහභාගිත්වයෙන් දාන, ශීල, භාවනා වැඩසටහන් පැවැත්වීම මගින් සමාජයේ අධ්‍යාත්මික ගුණවගාව වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම;

(ඕ) විද්‍යා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය උදෙසා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, පවත්වාගෙන යාම සහ ඒවායේ වැඩසටහන් පවත්වාගෙන යාම මගින් පාසල් සිසු දරු දැරියන්ගේ විද්‍යා දැනුම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම;

(ක) ආධාර උපකාර ලැබීමට සුදුසු අයගේ සමාජමය හා ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම සඳහා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම;

(ග) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු සංගමයේ ව්‍යවස්ථාවට අනුකූලව පත්කරගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා වූ පූජ්‍ය මාවරලේ භද්දිය ස්වාමීන් වහන්සේ විධායක සභාවේ යාවජීව සභාපතිවරයා විය යුතු ය. සභාපතිවරයා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය. උන්වහන්සේගෙන් පසු උන්වහන්සේ විසින් නම් කරනු ලැබූ අයකු ඊළඟ සභාපතිවරයා බවට පත්වන්නේ ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ විධායක සභාවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) සභාපතිවරයා හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හළහොත් මිස, වසර හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම සඳහා නව සමාජිකයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතු අතර, එම නව සාමාජිකයා පූර්වගාමී අධ්‍යක්ෂවරයාගේ වසර හතරක කාලයෙන් ඉතිරි කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාරගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ හා සේවයෙන් පහකරවීමේ බලය ද ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල, යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කරගැනීම, අස්කිරීම, ඉවත්කිරීම හෝ ඉල්ලා අස්වීම හා ඔවුන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු;

(ආ) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම එහි දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් හා සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්;

(ඈ) සංස්ථාවේ සහ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය සුදුසුකම්;

(ඉ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ ආකාරයෙන්ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට ලැබිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා බේරුම් කළ යුතු අතර, එදිනට පදනමට ලැබිය යුතුව තිබුණු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කිහිපයක තැන්පත් කළ යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි ලැබීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ තෙස්තමේන්තු නීයාදනයකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපල සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයකට පත්කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරන අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.